7861

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

81 S I

දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

කෘෂි හා ආහාර තාක්ෂණය - I
Agriculture & Food Technology

පැය එකයි
One hour

විභාග අංකය ....

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ('X') ලකුණ යොදන්න.

(01) විශිෂ්ට වාරි නිර්මාණයක් වන යෝධ ඇල සාදවනු ලැබුවේ,
1. පරාක්‍රමබාහු රජතුමා ය.
2. වළගම්බා රජතුමා ය.
3. ධාතුසේන රජතුමා ය.
4. දුටුගැමුණු රජතුමා ය.

(02) කෘෂි පාරිසරික කලාප සිතියම් කිරීමේ ප්‍රධාන වාසි වන්නේ,
A - කලාපයට සුදුසු බෝග නිර්දේශ කළ හැකි වීම
B - ඒකාකාරී දේශගුණික තත්ව ඇති කලාප හඳුනා ගැනීම.
C - උපරිම අස්වනු ලබා ගැනීමට කාලගුණික සාධක හැසිරවීම සඳහා
ඉහත ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි වන්නේ,
1. A හා B
2. B හා C
3. A හා C
4. A, B හා C

(03) වැවක අතිරික්ත ජලය පිටකිරීම සිදුකරනු ලබන්නේ,
1. සොරොව්ව මගිනි.
2. පිටවාන මගිනි.
3. බිසෝ කොටුව මගිනි.
4. රළපනාව මගිනි.

(04) ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය කුමක් ද?
1. ගල්ඔය ව්‍යාපාරය
2. මහවැලි ව්‍යාපාරය
3. ලුනුගම්වෙහෙර ව්‍යාපාරය
4. සමනල වැව ව්‍යාපාරය

(05) "තලවකැලේ" නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශයකි. එහි ඇති කෘෂිකාර්මික වැදගත්කම කුමක් ද?
1. බීජ අර්තාපල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටීම ය.
2. තේ පර්යේෂණ ආයතනය පිහිටීම ය.
3. කුරුඳු පර්යේෂණ ආයතනය පිහිටීම ය.
4. පොල් පර්යේෂණ ආයතනය පිහිටීම ය.

(06) වර්ෂාපතනය දක්වන සම්මත ඒකකය වන්නේ,
1. මිලි ලීටර් ය.
2. සෙන්ටි මීටර් ය.
3. අඟල් ය.
4. මිලි මීටර් ය.

(07) මින් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?
1. තෙත් කලාපයට වඩා වැඩි ආලෝක තීව්‍රතාවයක් වියළි කලාපයට ලැබේ.
2. ආලෝක තීව්‍රතාවයට වර්ෂාවේ බලපෑමක් නැත.
3. ආලෝක තීව්‍රතාවය වැඩිවන විට උත්ස්වේදන සීඝ්‍රතාවය වැඩි වේ.
4. සමහර සෙවන ප්‍රියකරන ශාකවලට වැඩි ආලෝක තීව්‍රතාවයක් ලැබීම නිසා පත්‍ර පිලිස්සීම සිදුවේ.

(08) පහත සඳහන් කවර ක්‍රියාවලියක් සඳහා පරිසර උෂ්ණත්වය අවම වශයෙන් බලපාන්නේ ද?
1. ප්‍රභාසංශ්ලේෂණය
2. සෛල විභාජනය
3. උත්ස්වේදනය
4. ශ්වසනය

(09) පහත දක්වෙන්නේ විවිධ කාලගුණික පරාමිතීන් මැන ගැනීමට යොදා ගන්නා උපකරණයි. ඒවායින් නොගැලපෙන පිළිතුර තෝරන්න.

1. වර්ෂාපතනය - වර්ෂාමානය
2. සුළඟේ වේගය - සුළං දිශා දර්ශකය
3. සාපේක්ෂ ආර්ද්‍රතාවය - තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය
4. ආලෝකය පවතින කාල සීමාව - සූර්ය දීප්තමානය

(10) සෙවන ප්‍රිය කරන ශාකයක් වන්නේ,

1. වී   2. බඩ ඉරිඟු   3. ඇන්තූරියම්   4. උක්

(11) පෘථිවිතලය මත වැඩිපුරම ව්‍යාප්ත වී ඇති පාෂාණ වර්ගය වන්නේ,

1. ආග්නේය පාෂාණ   2. අවසාදිත පාෂාණ
3. විපරිත පාෂාණ   4. ඉහත පාෂාණ වර්ග සියල්ලම

(12) පස් සාම්පලයක් ගෙන තරමක් තෙත්කර හොඳින් පදම් කර බෝලයක් සාදා දෙඅත්ල ආධාරයෙන් රෝල්කර මුදුවක් ආකාරයට නොකැඩෙන සේ සකසා ගත හැකි වන්නේ නම් එම පස

1. වැලි පසකි.   2. ලෝම පසකි.   3. මැටි පසකි.   4. වැලි ලෝම පසකි.

(13) පසක අඩංගු ඛනිජ අතරින් මි.මී. 0.02 - මි.මී. 0.002 අතර විෂ්කම්භය සහිත ඛනිජ අංශු වර්ගය වන්නේ,

1. රොන්මඩ ය.   2. බොරළු ය.   3. මැටි ය.   4. සියුම් වැලි ය.

(14) අධික ලෙස තද පසක පාංශු වාතනය දියුණු කිරීමට,

A. පසට ජලය යෙදිය යුතුය.
B. පසට කාබනික ද්‍රව්‍ය යෙදිය යුතුය.
C. පස බුරුල් කළ යුතුය.

මේවායින් නිවැරදි පිළිතුරු වන්නේ,

1. A හා B   2. B හා C   3. A හා C   4. A, B හා C

(15) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන පස් කාණ්ඩය වන්නේ,

1. ලැටරයිට් පස ය.   2. රතු දුඹුරු පස් ය.
3. රතු කහ ලැටසෝල් පස ය.   4. දියලු පස ය.

(16) කෙටි කාලීන බෝග වවන වගා භූමියක පාංශු පැතිකඩෙහි පැහැදිලිව නිරීක්ෂණය කළ නොහැකි පාංශු කලාපය වන්නේ,

1. A ය.   2. B ය.   3. C ය.   4. මාතෘ පාෂාණය.

(17) "ෆැබේසියේ කුලයේ බොහෝ ශාකවල මූල පද්ධතියේ මූල ගැටිති දක්නට ලැබේ" මේවා තුළ සහජීවීව ජීවත්වන බැක්ටීරියා වර්ගය නම්,

1. නයිට්‍රොසොමොනාස් ය.   2. සියුඩමොනාස් ය.
3. රෙසෝබියම් ය.   4. නයිට්‍රොබැක්ටර් ය.

(18) අස්වැන්න නෙළීමෙන් පසු ඉතිරි වන බෝග අවශේෂ, කාබනික පොහොර ලෙස පසට එකතු කළ විට වැඩිම නයිට්‍රජන් ප්‍රමාණයක් ලබා දෙන බෝග කාණ්ඩය වන්නේ,

1. වී, බඩඉරිඟු, කව්පි   2. තල, මුං, බඩඉරිඟු
3. වී, උක්, මුං   4. කව්පි, මුං, රටකජු

(19) ඖෂධ බෝගයක් මෙන්ම කුළු බඩු බෝගයක් ලෙස භාවිතයට ගන්නා බෝගයකි.

1. තිප්පිලි   2. කහ   3. පොල්පලා   4. හාතවාරිය

(20) ප්‍රයෝජන අනුව බෝග වර්ගීකරණයේ දී ආහාර ලෙස භාවිතයට නොගන්නා බෝග කාණ්ඩය නම්,

1. ධාන්‍ය බෝග ය.   2. කෙඳි බෝග ය.
3. අල බෝග ය.   4. පළතුරු බෝග ය.

(21) මූලික බිම් සකස් කිරීමේ ක්‍රියාවලියේ දී සිදු නොවන්නේ,

1. පස බුරුල් කිරීම ය.
2. පස පෙරළීම හා කැට පොඩි කිරීම ය.
3. පස සමග කාබනික පොහොර මිශ්‍ර කිරීම ය.
4. බෝගවල මුලට පස් යෙදීම හා වල්පැලෑටි මර්දනය.

♦ බිම් සැකසීමේ උපකරණ කිහිපයක නම් පහත සඳහන් වේ. 22 - 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී එම උපකරණ නාම සැලකිල්ලට ගන්න.

A - තැටිනගුල
B - උදැල්ල
C - ගැමි ලී නගුල
D - රිජරය

(22) බහුකාර්ය බිම් සැකසීමේ උපකරණයක් වන්නේ.
1. A 2. B 3. C 4. D

(23) සත්ත්ව බලයෙන් ක්‍රියා කරන උපකරණයක් වන්නේ,
1. A 2. B 3. C 4. D

(24) වැටි හා කානු ක්‍රමයට වගා ක්ෂේත්‍රය සැකසීමේ දී යොදා ගනු ලබන උපකරණය වන්නේ,
1. A 2. B 3. C 4. D

(25) බඩඉරිඟු, සෝයා බෝංචි, මුං, කව්පි, තල ආදී බීජ සංස්ථාපනයට යොදා ගන්නා උපකරණයකි.
1. FMRC ගොඩ බීජ වප්කරය 2. FMRC මඩ බීජ වප්කරය
3. ජපන් රොටරි වීඩරය 4. ගොයම් පැල සිටුවීමේ යන්ත්‍රය

(26) මුල්වලට හානි නොවන ලෙස පැළ ලබා ගත හැකි තවාන් වර්ගයකි.
1. උස් තවාන් 2. ගිල් වූ තවාන්
3. බඳුන් තවාන් 4. නොරිඩෝකෝ තවාන්

(27) මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ දේශීය ආහාර වර්ග නිෂ්පාදනය ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. පහත බෝග අතුරින් දේශීය ආහාර ඇතුළත් නිවැරදි කාණ්ඩය වන්නේ,
1. පැරණි වී ප්‍රභේද, කුරක්කන් හා මෙනේරි
2. පැරණි වී ප්‍රභේද, තිරිඟු, බාර්ලි
3. නව වී ප්‍රභේද, කුරක්කන්, බාර්ලි
4. තිරිඟු, මෙනේරි, සෝයා බෝංචි

(28) පැළ සිටුවීමේ රටා කිහිපයක් පහත දක්වේ.



A B C D

මේවායින් අක්‍රමවත් පැළ සිටුවීමේ ක්‍රමය කුමක් ද?
1. A 2. B 3. C 4. D

(29) තවාන් පාත්ති පිලිස්සීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. පසට ක්ෂුද්‍ර පෝෂක එකතු කිරීම ය. 2. පසේ ජෛව ගුණාංග දියුණු කිරීම ය
3. පාංශු රෝග කාරක විනාශ කිරීම ය. 4. පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම ය.

(30) ශිෂ්‍යයෙක් තම ගෙවත්තේ සිටුවීම සඳහා එකතු කරගත් බීජ වර්ග කීපයක් පහත පරිදි නම් කරන ලද කවර තුළ බහා තැබීය.

A කවරය	B කවරය	C කවරය	D කවරය
වම්බටු මාළු මිරිස් තක්කාලි	රාබු බීට් නෝකෝල්	කරවිල වැටකොළු පතෝල	කැරට් දඹල බුෂිටා මෑ

පාත්තිවල තවාන් දමා පැළ, සිටුවීම සඳහා ඔබ යෝජනා කරන බීජ අඩංගු කවරය වනුයේ,
1. A ය 2. B ය 3. A හා C ය 4. D ය

(31) බඳුන් තවාන් සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,
1. සුලු පරිමාණ හෝ මහා පරිමාණ වගා සඳහා පැළ සකස් කිරීමට යෝග්‍ය ක්‍රමයකි.
2. බඳුන් තවාන් මගින් ලබාගන්නා පැළ ඉතා පහසුවෙන් රෝග හා කෘමි පළිබෝධවලට පාත්‍ර වේ.
3. තවාන් සඳහා යෝග්‍ය භූමියක් නොමැති විට බඳුන් තවාන් යෝග්‍ය වේ.
4. තවාන් පැළවල මූල පද්ධතියට අවම හානියක් වන නිසා සාර්ථක වගාවක් ලබා ගත හැක.

(32) පහත බෝග අතුරින් ගැඹුරින්ම සිටුවන බීජ වර්ගය වන්නේ,
1. ගෝවා 2. බෝංචි 3. ලීක්ස් 4. සලාද

(33) බටඅත පිහිටි කෘෂි තාක්ෂණ උද්‍යානය අයත් දිස්ත්‍රික්කය වනුයේ,
1. ගාල්ල 2. මාතර 3. හම්බන්තොට 4. කලුතර

(34) තවාන් පැළ දැඩි කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි.
1. ජලය යෙදීම. 2. සෙවන සැපයීම.
3. සූර්යාලෝකයට නිරාවරණය කිරීම. 4. පොහොර යෙදීම.

(35) තවාන් වසුන් කිරීම සඳහා වඩාත් සුදුසු ද්‍රව්‍යයක් වන්නේ,
1. ග්ලිරිසිඩියා පත්‍ර 2. වියළි කොළ රොඩු
3. ජීවානුහරිත අලුත් පිදුරු 4. වියළි ලී කුඩු

(36) රතු දුඹුරු පැහැයෙන් යුත් ජලයේ හොඳින් දියවෙන කුඩා ස්ඵටික ලෙය පවතින රසායනික පොහොර වර්ගය වන්නේ,
1. රොක් පොස්පේට් 2. යූරියා
3. ට්‍රිපල් සුපර් පොස්පේට් 4. මියුරේට් ඔෆ් පොටෑෂ් ය

(37) ශාක වර්ධනයේ දී අත්‍යවශ්‍ය වන මහා පෝෂක පමණක් අඩංගු වරණය වන්නේ,
1. කාබන්, නයිට්‍රජන්, මැංගනීස් 2. ඔක්සිජන්, හයිඩ්‍රජන්, සින්ක්
3. කාබන්, නයිට්‍රජන්, පොටෑසියම් 4. කැල්සියම්, මැග්නීසියම්, යකඩ

(38) දැනට භාවිතා කරනු ලබන ඉතාමත් කාර්යක්ෂම හා සූක්ෂම ජල සම්පාදන ක්‍රමය වන්නේ,
1. බේසම් ජල සම්පාදනය යි. 2. විසුරුම් ජල සම්පාදනය යි.
3. බිංදු ජල සම්පාදනය යි. 4. තීරු ජල සම්පාදනය යි.

(39) බෝග වගාවේ දී පොහොර යෙදීම පිළිබඳව වගන්ති කිහිපයක් පහත දක්වේ.
A - ක්ෂේත්‍රයට දිගින් දිගටම යෙදීමේ දී පසේ pH අගය අහිතකර පරිදි වෙනස් වීම
B - වැඩිපුර පසට යෙදීමෙන් භූගත ජලය ඇතුළු ජල ප්‍රභව දූෂණය වීම
C - පසෙහි ක්ෂුද්‍ර ජීවී ගහනය වැඩි කිරීමට හේතු වේ.
මින් රසායනික පොහොර යෙදීමෙන් ඇතිවන අහිතකර බලපෑම් සඳහන් වගන්ති වන්නේ,
1. A පමණි. 2. B හා C පමණි.
3. A හා B පමණි. 4. A හා C පමණි.

(40) පාංශු කාබනික ද්‍රව්‍ය පිළිබඳව වගන්ති කිහිපයක් පහත දී ඇත.
A - කාබනික ද්‍රව්‍ය පසේ ජීවීන්ගේ ක්‍රියාකාරිත්වයට හිතකරවේ.
B - පසේ ජල අවශෝෂණ ධාරිතාවය අඩු කරයි.
C - කැටායන හුවමාරු ධාරිතාවය දියුණු කරයි.
මින් වඩාත් නිවැරදි වන්නේ,
1. A පමණි. 2. A හා B පමණි.
3. C පමණි. 4. A හා C පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

81 S II

දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

කෘෂි හා ආහාර තාක්ෂණය - II
Agriculture & Food Technology

පැය දෙකයි
Two hours

විභාග අංකය ……………………………

සැලකිය යුතුයි.

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

---

(01) කෘෂි හා ආහාර තාක්ෂණය විෂයය හදාරන සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා වර්ධනය කර ගැනීම සහ කෘෂි විද්‍යා ඒකකය තුළ ඉගෙනුම් පරිසරයක් සකස් කර ගැනීම සඳහා පාසලේ කෘෂි විද්‍යා විෂයය භාර ගුරුතුමිය විසින් 10 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායම් කර පහත සඳහන් පරිදි ක්‍රියාකාරකම් ඉටු කර තැබීමට උපදෙස් ලබා දෙන ලදී.

I. කණ්ඩායම - ශාක කුල අනුව වෙන් කරන ලද බීජ එකතුවක් සකස් කිරීම
II. කණ්ඩායම් - වල් පැළෑටි, කෘමි පළිබෝධකයින් සහ පොහොර නිදර්ශක කට්ටල සකස් කිරීම
III. කණ්ඩායම - තවාන් වර්ග සකස් කර තැබීම.
IV. කණ්ඩායම - ජල සම්පාදන ක්‍රම සඳහා ආකෘති සැකසීම
V. කණ්ඩායම - පරිසර හිතකාමී පළිබෝධ නාශක නිදර්ශක සැකසීම

(i) ඉහත ක්‍රියාකාරකම් හි නිරත වූ I කණ්ඩාමේ සිසුන් විසින් බටු, මිරිස්, තක්කාලි වැනි බීජ වර්ග ඇතුළත් කරන ලද ශාක කුලය කුමක් ද?
(ii) පොඒසියේ කුලය යටතට ඔවුන් විසින් වෙන් කරන ලද බීජ වර්ග දෙකක් සඳහන් කරන්න.
(iii) III කණ්ඩායමේ සිසුන් විසින් සකස් කර තැබිය හැකි තවාන් වර්ග හතරක් සඳහන් කරන්න.
(iv) පාෂ්ඨීය ජල සම්පාදන ක්‍රම සඳහා IV කණ්ඩායමට අදාල සිසුන් විසින් සකස් කළ හැකි ආකෘති දෙකක් ලියන්න.
(v) II කණ්ඩායමට අදාල වූ ක්‍රියාකාරකම්හි නිරත වූ සිසුන් විසින් හඳුනාගන්නා බහුවාර්ෂික වල් පැළෑටි දෙකක් ලියන්න.
(vi) ඔවුන් විසින් රූපාකාරය අනුව වල් පැළෑටි වර්ගීකරණය කරනු ලබන ආකාරය සඳහන් කරන්න.
(vii) වල් පැළෑටිවල පොදු ලක්ෂණ හතරක් ලියන්න.
(viii) පසට නයිට්‍රජන් ලබා ගැනීම සඳහා සිසුන් විසින් එක්රැස් කරනු ලබන නයිට්‍රජන් අඩංගු පොහොර නිදර්ශක වර්ග දෙකක් නම් කරන්න.
(ix) ගොවිපලේදීම නිපදවා ගත හැකි කාබනික දියර පොහොර වර්ග දෙකක් ලියන්න.
(x) V කණ්ඩායමට අදාල සිසුන් විසින් සකස් කර තැබිය හැකි පරිසර හිතකාමී පළිබෝධනාශක නිදර්ශක දෙකක් සඳහන් කරන්න.

(02) පහත රට තෙත් කලාපයේ ගොවීන් විසින් වී ගොවිතැන මෙන්ම ක්ෂේත්‍ර බෝග වගාව ද සිදුකරති.
(i) a) පහතරට තෙත් කලාපයට වර්ෂාව ලැබෙන්නේ කුමන මෝසම් සුළං මගින් ද?
b) එම මෝසම් සුළං ලැබෙන මාස කවරේ ද?
(ii) බෝග වගාවේ දී වර්ෂාපතනයේ හිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.
(iii) පුෂ්ප හට ගැනීමේ දී, දිවා කාලයේ දිගට ශාක දක්වන ප්‍රතිචාරය අනුව බෝග කාණ්ඩ තුනකට වෙන් කළ හැකිය. එම බෝග කාණ්ඩ තුන කවරේ ද?

(03) සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම සඳහා ක්ෂේත්‍රයේ බෝගය සංස්ථාපනයෙන් පසු හොඳින් රැක බලා ගත යුතුයි.
(i) බෝග වගාවේ දී කළ යුතු පශ්චාත් සාත්තු මොනවාද?
(ii) a) බෝග වගාවේ දී ජලයේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න.
b) පසට යොදනු ලබන ජලය සංරක්ෂණය කිරීමට ඔබ යෝජනා කරන ක්‍රම දෙකක් ලියන්න.
(iii) බෝග වගාවට සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න.

(04) (i) ශ්‍රී ලංකාවේ එක් එක් ප්‍රදේශවල උෂ්ණත්වයේ විචල්‍යතාවයන් පවතී. මෙයට හේතුවන සාධක මොනවාද?

(ii) ශිෂ්‍යයෙක් පාංශු සංඝටක වෙන් කිරීමේ පරීක්ෂණයක් සඳහා පස් සාම්පලයක් ගෙන බීකරයකට දමා ජලය යොදා කලතන ලදී. පසුව ද්‍රව්‍යය තැන්පත් වීමට තබන ලදී. එම ඇටවුම පහත දැක්වේ.



a) මෙහි A → F දක්වා ඛනිජ අංශු නම් කරන්න.

b) මෙහි ජලයේ අවලම්බනය වී ඇති කුඩාම ඛනිජ අංශුව කුමක් ද?

(iii) පසක් ආම්ලික වීම බෝග වගා කිරීමේ දී ඇතිවන ගැටලුවකි. ආම්ලිකතාවයට පත් වූ ක්ෂේත්‍රයක් යථා තත්ත්වයට පත්කර ගැනීමට යෙදිය හැකි ද්‍රව්‍ය **තුනක්** සඳහන් කරන්න.

(05) සාර්ථක බෝග වගාවක් සඳහා ක්‍රමවත්ව බිම් සැකසීම අත්‍යවශ්‍ය කරුණකි.

(i) a) මූලික බිම් සැකසීම යනු කුමක් දැයි අර්ථ දක්වන්න.

b) මූලික බිම් සැකසීමට අයත් කාර්යයන් **හතරක්** ලියන්න.

(ii) භාවිත කරනු ලබන අවස්ථාව අනුව බිම් සැකසීමේ උපකරණ කොටස් තුනකි. ඒවාට නිදසුන් **දෙක** බැගින් ලියන්න.

a) ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ

b) ද්විතියික බිම් සැකසීමේ උපකරණ

c) අතුරුයත්ගෑමේ උපකරණ

(iii) a) බීජ තවාන් දැමීමේ අරමුණු **හතරක්** ලියන්න.

b) තවාන් ජීවානුහරණය කරගත හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

(06) (i) a) පාංශු ව්‍යුහය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද? යන්න පැහැදිලි කරන්න.

b) කෘෂිකර්මාන්තයේ දී වගා බිමක පාංශු ව්‍යුහය දියුණුකර ගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) පාංශු ජීවීන් මගින් වගා බිමක ඇති කරනු ලබන යහපත් බලපෑම් **තුනක්** ලියන්න.

(iii) ජල වහනය දුර්වල වීමෙන් බෝග වගාවට සිදුවන අහිතකර බලපෑම් **දෙකක්** දක්වන්න.

(07) බෝග වගාවේ දී කාබනික පොහොර යෙදීමට අමතරව පෝෂණ අවශ්‍යතා සපිරෙන පරිදි රසායනික පොහොර යෙදීම ද සිදුවේ. මෙහි දී පොහොර භාවිත කාර්යක්ෂමතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

(i) a) කාබනික පොහොර යෙදීමෙන් පසෙහි දියුණුවන ප්‍රධාන ගුණාංග **හතරක්** ලියන්න.

b) ඉහත පොහොර භාවිත කාර්යක්ෂමතාවය යනුවෙන් අදහස් කරන ලද්දේ කවරක් ද?

(ii) බහුල වශයෙන් භාවිත කරනු ලබන ප්‍රධාන කාබනික පොහොර වර්ග **හතරක්** නම් කරන්න.

(iii) පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.